ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ පුවත්පත
නො 762/04 බී, පන්නිපිටිය පාර, බත්තරමුල්ල
දුරකථන/ෆැක්ස් : 2884431, 011-5662895
විද්‍යුත් තැපැල : sltr@sysnet.lk

# නිවුන් පුවත්

කාණ්ඩ අංක 04 | අගෝස්තු - 2007 | පිටු අංක 1-4

# ශ්‍රී ලංකාවේ බහුල ව පවතින මානසික ගැටළු පිළිබඳ අධ්‍යයනය සාර්ථක ලෙස ඉදිරියට

මීට වසර කිහිපයකට පෙර ආරම්භ කළ, ශ්‍රී ලංකාවේ බහුල ව පවතින මානසික ගැටළු පිළිබඳ අධ්‍යයනය මේ වන විට සාර්ථක ලෙස අවසන් වෙමින් පවතී. බස්නාහිර පළාතේ සිටින නිවුන් සහ නිවුන් නොවන පුද්ගලයන් ඇසුරින් සිදු කරනු ලබන මෙම අධ්‍යයනයෙන් ඉතා සාර්ථක ප්‍රතිඵල ලැබී ඇත. මේ වන විට නිවුන් පුද්ගලයන් 3500 කට අධික සංඛ්‍යාවක් මෙම අධ්‍යයනය සඳහා සහභාගී වී ඇත. අධ්‍යයනය සඳහා නිවුන් පුද්ගලයින්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රදේශයේ ග්‍රාමනිලධාරී මහත්ම මහත්මීන් සමඟ නිවුන් සංගණනයක් 2004 වසරේ දී කරන ලදී.



අධ්‍යයනයට සහභාගී වූ දේශීය හා විදේශීය විද්වතුන් සහ පර්යේෂණ සහායක සහායිකාවන්

එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ සියළුම වයස් කාණ්ඩවල නිවුන් යුගල 10000කට ආසන්න ප්‍රමාණයක් සිටින බව අනාවරණය විය.

3 පිටුවට

# නළ දරු තාක්ෂණයෙන් (IVF Technology) ලොව දකිනා නිවුන් දරුවන්

මෑත භාගයේ ජන මාධ්‍ය වලින් බහු දරු උපත් පිළිබඳ ව නොයෙකුත් ලිපි ලේඛන එළි දැක්විණි. ඒ අතුරින් තුන් දරු සහ පස් දරු උපත් අප කාගේත් වැඩි අවධානයකට ලක් විය. මිනිස් මොළයෙන්, මිනිස් බුද්ධියෙන් ස්වභාව ධර්මයාගේ රීතීන් ප්‍රතිනිර්මාණය කිරීමට හැකි වූ දා පටන් මිනිසා අපූරු වූ විශ්මිත දෑ ලොවට දායාද කළේ ය. IVF(In-Vitro-Fertilization) තාක්ෂණය ද මිනිසා ස්වභාව ධර්මයාගේ රීතිය තම දෑතට ගෙන ප්‍රතිනිර්මාණය කළ දයකි. ස්වභාවික ක්‍රියාවලියක්, ඉතාමත් උසස් මට්ටමේ විද්‍යාගාරයක් (State of the Art System) තුළ ප්‍රතිනිර්මාණය කර, ඒ තුළින් ස්වභාවික ක්‍රියා වලිය සතු ප්‍රතිඵලය ම නැවත ලබා ගැනීම මෙහි දී සිදු කෙරේ. වික්‍රමයකි, අප දන්නා පරිදි පුරුෂ ශුක්‍රාණුවක් ස්ත්‍රී ඩිම්බයක් සමඟ එකතු වී ගොඩ නැගෙන යුක්තාණුව තව දුරටත් වර්ධනය වී කළලයක් (Foetus) ගොඩ නැගී අවසානයේ අංග සම්පූර්ණ දරුවකු දක්වා වර්ධනය වෙයි. සමහර අවස්ථාවන් හි දී නොයෙකුත් ජීවී (Biotic) සහ අජීවී (Abiotic) හේතු සාධක

3 පිටුවට

ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය 1997 දී ආරම්භ කරන ලද, වෘත්තීයවේදීන්ගේ ආයතනයකි. නිවුන් පුද්ගලයන් ඇසුරින් සෞඛ්‍ය ක්ෂේත්‍රයට සහ වෙනත් ක්ෂේත්‍ර වලට අදාල ගැටලු හඳුනා ගෙන, එම ගැටලුවලට පිළියම් කිරීම සඳහා පර්යේෂණ හරහා රාජ්‍ය ප්‍රතිපත්ති නිවැරදි ලෙස සැකසීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ මානුෂීය මෙහෙවරකට උර දී සිටින, දේශීය පර්යේෂණ ආයතනයකි.

## නිවුන් ලේඛනාගාරය අලුත් තැනකට



මෙතෙක් මුල්ලේරියාව නව නගරයේ තිබූ ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය, දන් 762/4 බී, පන්නිපිටිය පාර, බත්තරමුල්ල යන ලිපිනයෙහි පිහිටා තිබෙන ගොඩනැගිල්ලට ගෙනවිත් තිබේ.

## ගම්පහ දිස්ත්‍රික්කය තුළත් නිවුන් පුද්ගලයන් ඇසුරින් මානසික සෞඛ්‍ය පිළිබඳ අධ්‍යයනයක්

කොළඹ දිස්ත්‍රික්කයේ නිවුන් පුද්ගලයන් ඇසුරින් සිදු කළ මානසික සෞඛ්‍යය පිළිබඳ අධ්‍යයනය, කොළඹින් පිට දිස්ත්‍රික්කවලට ද ව්‍යාප්ත කිරීමට කටයුතු යොදා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කය තුළ ද එම අධ්‍යයනය සිදු කිරීමට සියලු කටයුතු සූදානම් වෙමින් පවතී.



ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ තොරතුරු දැන ගැනීමට

**www.infolanka.com/org/twin-registry**

ලිපිනයෙන් අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න.

# ස්තූතිය

නිවුන් අධ්‍යයනය ආරම්භයේ සිට අවසානය තෙක් නන් අයුරින් සහාය ලබා දුන් ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් මහත්ම මහත්මීන්ටත්, අධ්‍යයනයට සහභාගී වූ නිවුන් සහ නිවුන් නො වන පුද්ගලයින්ටත් අනෙකුත් සියලු දෙනාටත් අපගේ නො මඳ ස්තූතිය පළ කරමු.

පර්යේෂණයට සහභාගී වීම හේතුවෙන් ලබා දුන් රු 300/-ක මුදල නැවත ආයතනයට පරිත්‍යාග කළ සියලුම දෙනාට ද අපගේ නොමඳ ස්තූතිය පළ කරමු.

# උසස් පෙළ ව්‍යාපෘති සඳහා අපෙන් අත්වැලක්



උසස් පෙළ ව්‍යාපෘති සකස් කිරීමේ දී නිවුන් පුද්ගලයන් ආශ්‍රයෙන් සිදු කරන ව්‍යාපෘති සඳහා අවශ්‍ය නවතම තොරතුරු ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයෙන් ලබා ගැනීමට ඔබට අවස්ථාව උදා වී ඇත.

ඒ පිළිබඳ ව දැනගැනීමට 2884431 සහ 5662895 යන දුරකථන අංක වලින් අප අමතන්න.

### කොළඹ දිස්ත්‍රික්කයේ නිවුන් අධ්‍යයනයේ වාර්තා ඇසුරින්

*(විවිධ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් රැස් කර ගන්නා ලද නිවුන් පුද්ගලයන් ගණන)*

| | පිරිමි | ගැහැනු |
|---|---|---|
| කොළඹ | 131 | 203 |
| දෙහිවල | 67 | 58 |
| හංවැල්ල | 117 | 158 |
| හෝමාගම | 242 | 250 |
| කැස්බෑව | 216 | 267 |
| කොළොන්නාව | 172 | 157 |
| කෝට්ටේ | 125 | 88 |
| මහරගම | 245 | 229 |
| මොරටුව | 99 | 142 |
| පාදුක්ක | 97 | 130 |
| රත්මලාන | 53 | 56 |
| තිඹිරිගස්යාය | 113 | 110 |





# නිවුන් ක්‍රමවේදය පිළිබඳ ව යමක්

අප දන්නා ආකාරයට නිවුන්නු ප්‍රධාන වශයෙන් ආකාර 2 කට අයත් වෙති. එනම් සම නිවුන්නු (Identical Twins) හෙවත් ඒක යුක්තාණුක නිවුන්නු (Monozygotic Twins) සහ අසම නිවුන්නු (Non-Identical Twins) හෙවත් සහෝදර (Fraternal) ද්වි යුක්තාණුක (Dizygotic Twins) නිවුන්නු ලෙස ය. දරුවකු බිහි වීමේ දී මවගේ ඩිම්බය (Ovum) පියාගේ ශුක්‍රාණුවක් (Spertmatozoon) සමඟ එකට සම්බන්ධ වේ. එම ක්‍රියාවලිය සංසේචනය (Fertilization) නම්.

මෙම ඩිම්බ සහ ශුක්‍රාණු පොදුවේ ජන්මාණු සෛල ලෙස හඳුන්වන අතර, ඒවා ඒක ගුණ සෛල වේ. එනම් වර්ණ දේහ යුගල භාගයක් අන්තර්ගත වේ. මෙකී ඒක ගුණ සෛල 2ක් එකතු වීම තුළින් ද්විගුණ සෛලයක් ගොඩ නැගේ. සංසේචනයේ ප්‍රතිඵලය ලෙස, මුලින් ම ඇති වන ද්විගුණ සෛලය යුක්තාණුව (Zygote) නම්. මෙම යුක්තාණුව බිහිවීමත් සමඟ අනාගතයේ බිහි වන දරුවා ගැහැනු (Female) දරුවකු ද පිරිමි (Male) දරුවකු ද යන්න තීරණය වේ.

ඒක යුක්තාණුක හෙවත් සම නිවුන්නු සෑම විට ම එක ම ලිංගිකත්වයක් (Same Gender) නිරූපණය කරති. ද්වි යුක්තාණුක හෙවත් අසම නිවුන්නු එකම ලිංගිකත්වයක් හෝ වෙනස් ලිංගිකත්ව (Different Gender) නිරූපණය කරති.

සම නිවුන්නු එක යුක්තාණුවක් මුල් කර ගෙන ජනිත වන නිසා ප්‍රවේණික ද්‍රව්‍යවල හවුල් වීමේ ප්‍රතිශතය 100% ක් වන අතර, අසම නිවුන්නු සඳහා එකී අගය 50%ක් ගනී. ඕනෑම ජීවියකු බාහිර ලෝකයට විද්‍යමාන වන ස්වරූපය එනම් රූපාණුදර්ශය (Phenotype) එකී ජීවියාගේ ප්‍රවේණි දර්ශය (Genotype) සහ හැදෙන වැඩෙන පරිසරයේ (Environment) ගුණිතයක් (P=GxE) ලෙස, පිළි ගත් සාධාරණ වූ සත්‍යයක් ඇත. නිවුන් ක්‍රමවේදයේ දී සම නිවුන්නු, අසම නිවුන්නු සහ සාමාන්‍ය නිවුන් නො වන පුද්ගලයන් (Singletons) යන සියලු ම දෙනාගෙන් දත්ත එක් රැස් කරනු ලැබේ. එකී දත්ත තොරතුරු රැස් කිරීම සඳහා සම්මත පිළිගත් ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ.

ඉන් පසු එම දත්ත නිවැරදි ව විශ්ලේෂණය කර ඒ හරහා නොයෙකුත් ගති ලක්ෂණ සහ සමහර හැසිරීම් රටා සඳහා පරිසරයේ සහ ප්‍රවේණියේ සාපේක්ෂ බලපෑම සොයා බැලිය හැකි ය. මෙය මානව ප්‍රගමණයේ උන්නතිය සඳහා භාවිත කළ හැකි අපූරු ක්‍රමවේදයකි.

# අපේ නිවුන් පර්යේෂකයින් සංගණනයේ දී ලද අත්දැකීම් වලින් ...

➢ දිනක් පර්යේෂණ සහායිකාවක පර්යේෂණයක් සඳහා අදාළ නිවසට ගොස්, ප්‍රශ්නාවලියෙන් තොරතුරු අසා එම නිවසින් පිටත් ව යාමට සැරසෙද්දී, නිවසේ සිටි සුනඛයෙක් ඇය ව සපා කෑවේය. තුවාල සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට ඇයට සිදුවිය.

➢ ප්‍රශ්නාවලිය අසන අතරතුරේ දී පියාගේ වයස පිළිබඳ ව ප්‍රශ්නාවලියට අදාළව ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කර පර්යේෂකයාට වහාම නිවසින් පිට ව යන ලෙස නිවැසියන් බැණ වැදීම.

➢ පර්යේෂණයට සහභාගී වන සමහර පුද්ගලයන් මෙම පර්යේෂණයේ වැදගත්කම, මෙවැනි පර්යේෂණයක කාලෝචිත බව, මෙම අධ්‍යයනය කෙරෙන ආකාරයේ විධිමත් බව, ප්‍රශ්නාවලිය ඇසීමේ දී භාවිතා කරන ක්‍රම වේදයේ නිරවද්‍යතාව ගැන පැහැදී පර්යේෂණ සහායකට ප්‍රශංසාකර, පර්යේෂණයේ දී ඔවුන්ට ලබා දෙන රු. 300/-ක මුදල ද නැවත ආයතනයට ම ලබා දීම.

➢ සමහර පුද්ගලයන් පර්යේෂණයට සහභාගී වීමට කැමති බව ප්‍රකාශ කළත්, නියමිත වේලාවට එම ස්ථානයට යාමේ දී අදාළ පුද්ගලයා නිවස වසා පිටව ගොස් සිටීම හා තවත් සමහර පුද්ගලයන් නිවස තුළ සිටිය ද පිටතට නොපැමිණීම නිසා පර්යේෂකට ආපසු හැරී ඒමට සිදු වීම.

➢ මෙම අධ්‍යයනය මානසික සෞඛ්‍ය පිළිබඳ ව සිදු කෙරෙන පර්යේෂණයක් නිසා මානසික යන වචනය පිළිබඳ ව සමාජ යේ ඇති දුර්මත හේතුවෙන් පර්යේෂණ සහායකට අධ්‍යයනය පිළිබඳ දිගින් දිගට ම පැහැදිලි කිරීමට සිදු වීම. ඉන් පසු බොහෝ පිරිස ඒ සඳහා ඉතා ඕනෑකමින් කැමැත්තෙන් සහභාගී වූ අතර ම ඉතා සුළු පිරිසක් ඒ සඳහා සහභාගී වීම ප්‍රතික්ෂේප කිරීම.

➢ මේ අධ්‍යයනය, එයට සහභාගී වන පුද්ගලයාගේ කැමැත්ත මත සිදු වන බැවින් ප්‍රශ්නාවලිය ඇසීමට ප්‍රථම ඒ පිළිබඳ දැනුවත් කර කැමැත්ත ලබා ගැනීමට යාමේ දී අධ්‍යයනයට ඉතා ඕනෑකමින් කැමති වුව ද අත්සන ලබා දීමට ප්‍රතික්ෂේප කිරීම නිසා පර්යේෂණ සහායක දැඩි අපහසු තාවකට පත් වීම.

පළමුවැනි පිටුවෙන්

## මානසික ගැටළු පිළිබඳ අධ්‍යයනය.....

එම නිවුන් යුගල් අතුරින් අහඹු ලෙස, තෝරා ගත් නිවුන් යුගල (වයස අවු:15ත් 65ත් අතර) 2,000කට මෙම අධ්‍යයනය සඳහා සහභාගී වීමට ආරාධනා කරනු ලැබිණි. එම සෑම පුද්ගලයකු වෙත ම අප ආයතනයෙන් පුහුණු පර්යේෂණ සහායකයකු බැගින් යොමු කර අවශ්‍ය දත්ත ලබා ගන්නා ලදී. මොවුන් අතුරින් බොහෝ දෙනා මෙම අධ්‍යයනයට ඉතා උනන්දුවෙන් සහභාගී වීම, අප රට තුළ සිදු කරන මෙවන් දූරදර්ශී පර්යේෂණ ක්‍රියාවලියක අනාගතය පිළිබඳ සුභ ලකුණකි. අප වැනි දියුණු වෙමින් පවතින රටකට මෙවැනි අධ්‍යයනයක් අලුත් අත්දැකීමකි. එමෙන් ම අප රට තුළ මේ සඳහා ඉතා ම යෝග්‍ය වතාවරණයක් ද පවතී. බටහිර රටවල මෙන් නො ව, අතීතයේ සිට ම අප තුළ පැවත එන මහඟු ගුණාංගයක් වන ආගන්තුක සත්කාරය (Hospitality) මෙයට හොඳ නිදසුනකි.

නිවුන් පුද්ගලයන් සමාජයේ සුවිශේෂී කොට්ඨාසයකි. ඔවුන්ට ම ආවේණික වූ සමහර ගති ලක්ෂණ හා යම් යම් පුරුදු තිබිය හැකි ය. ඔවුන් ස්වභාව ධර්මයෙන් ම අපට උරුම කර දුන් පර්යේෂණාගාර වැනි ය.එම නිවුන් යුගල් අතුරින් අහඹු

## සාර්ථක බද්ධ නිවුන් වෙන් කිරීමක්

### තායිලන්තය නැවත වරක් ලෝක අවධානයට



තායිලන්තය හා නිවුන්නු අතර ඇත්තේ අපූරු මෙන් ම ඓතිහාසික සම්බන්ධතාවකි. සියම් නිවුන්නු ලෙස එන් බන්කර් උපන්නේ ද තායිලන්තයේ ය. ඒ 1811 දී ය. මේ යුගල පසු කාලීන ව "සියම් නිවුන්නු" (Siamese Twins) ලෙස, ලෝ ප්‍රකට විය.

පසුගිය පෙබරවාරි මාසයේ තායිලන්තය නැවත වරක් ලෝක අවධානය දිනා ගන්නා ලදී. එනම් උදර ප්‍රදේශයෙන් සහ පපු ප්‍රදේශයෙන් එකිනෙකට බද්ධ වූ අට මස් වයස නිවුන් දරියන් දෙදෙනකු ඉතාමත් සාර්ථක ලෙස වෙන් කිරීම නිසා ය.

හෘදයෙන් හා අක්මාවෙන් එකිනෙකට සම්බන්ධ වූ මේ කුඩා දරියන් දෙදෙනා පැය 12ක දීර්ඝ ශල්‍ය කර්මයකින් පසු වෙන් කරන ලදී. හෘද වෛද්‍යවරුන් 5 දෙනකු ඇතුළු ව 61කුගෙන් සමන්විත කාර්‍ය මණ්ඩලයක් මේ කටයුත්තට සහභාගී වූහ. මේ ආකාරයේ බද්ධ නිවුන් යුගලක් සාර්ථක ව වෙන් කළ ප්‍රථම අවස්ථාව මෙය වන බව විද්වතුන්ගේ අදහස යි.




පළමුවැනි පිටුවෙන්

## නළ දරු තාක්ෂණයෙන් .....

මත මෙම ස්වාභාවික ක්‍රියාවලිය අඩපණ හෝ අක්‍රිය විය හැකි ය.

එවන් අවස්ථාවල දී IVF තාක්ෂණය අනුසාරයෙන් දරු ඵල ලබා ගැනීමේ හැකියාව ඇත. සැබවින් ම මෙය කෘත්‍රිම ආකාරයට ගැබ් ගැනීමේ ක්‍රියාවලියකි. වර්ෂ 1978 දී IVF ක්‍රමය සාර්ථක ව අත්හදා බලන ලද අතර, මෙම තාක්ෂණය හරහා ලොව පුරා 20.000කට අධික දරු උපත් සංඛ්‍යාවක් සිදු කර ඇති බවට වාර්තා වේ. IVF ක්‍රමය හරහා දරුවන් ලබා ගැනීමේ දී බොහෝ කරුණු පිළිබඳ ව පූර්ව සොයා බැලීමක් කළ යුතු ය. මෙහි දී ස්ත්‍රියගේ හා පුරුෂයාගේ වයස, ප්‍රජනන සෞඛ්‍ය යන කාරණා පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කෙරේ.

විශේෂයෙන් ම කාන්තා පාර්ශවය පෙර සූදානමකට ලක් කරනු ලැබේ. මේ ආකාරයට ගැබ් ගැනීම පිළිබඳ ව අනාවැකි ප්‍රකාශ කිරීමට අපහසු ය.

මන්ද මෙය විවිධ සාධක බොහෝමයක බලපෑමට නතු වන ක්‍රියාවලියක් හෙයින් පුරුෂ සහ ස්ත්‍රී ජන්මාණු කෘතීම පරිසරයක් තුළ දී එකිනෙකට මුණ ගස්වා ගොඩ නැගෙන යුක්තාණු, පූර්ව කළල අවස්ථාවක් දක්වා වර්ධනය කිරීම පෝෂණ මාධ්‍යයක් තුළ දී සිදු වෙයි.

දරුවකු වර්ධනය සාර්ථක වීමේ සම්භාවිතාව ඉහළ දැමීම සඳහා එකී පූර්ව කළල අවස්ථාවේ ඇති යුක්තාණු කිහිපයක් ගර්භාෂයේ තැන්පත් කරනු ලැබේ.

බොහෝ මව්වරුන් අවශ්‍ය උපදෙස් නිසි පරිදි පිළිපදින නිසා ගබ්සා සිදු වන ප්‍රමාණය අඩු වී, තැන්පත් කරන බොහෝමයක් කළල ප්‍රතිඵලදායක ලෙස වර්ධනය වී අවසානයේ දරුවන් කිහිප දෙනකු ලැබීමේ වාසනාව උදා වේ. මේ නිසා තුන් නිවුන්, පස් නිවුන් වැනි දරු උපත් පිළිබඳ ව විවිධ ප්‍රදේශවලින් වාර්තා වේ.

මෙසේ උපදින නිවුන් දරුවන් ප්‍රවේණික ව එකිනෙකට වෙනස් වන අසම නිවුන් දරුවෝ වෙති.

## ශ්‍රී ලංකාවට ජයක් හිමිකර දීමට තරම් ඇය වාසනාවන්ත විය



ඇය නමින් චතුරිකා එරන්දි ය. ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ TW 6446 දරණ අංකය යටතේ නිවුන් සාමාජිකයකු ලෙස ඇය කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ අධ්‍යාපනය හදාරයි. ඉගෙනීමට හා ක්‍රීඩාවට උපන් හපන්කම් දක්වුවත් එම ක්ෂේත්‍රවලින් ඉදිරියට යාමට ඇයට හරස් වී ඇත්තේ අර්ථික අපහසුතා ය. මෙවැනි පසුබිමක් තුළ පාසල් මලල ක්‍රීඩා සංගමය, කොළඹ පාසල් මට්ටමේ ජාතික මලල ක්‍රීඩා උළෙලට සහභාගී වූ ඇයට, එහි දී දක්වූ දක්ෂතා මත ඉන්දියාවේ බැංගලෝර් හි පැවැත්වෙන කනිෂ්ඨ මලල ක්‍රීඩා උළෙලට සහභාගී වීමට වාසනාව උදා විය. ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය ද ඇයට ඒ සඳහා අනුග්‍රහයක් ලබා දීමට කටයුතු කළේ ය. නොබෝ දා ඇය විසින් ශ්‍රී ලංකා නිවුන් ලේඛනා ගාරය වෙත යොමු කළ ලිපියකින් දන්වා සිටියේ, ඇය සහභාගී වූ තරඟ සඳහා ජයග්‍රහණ හිමි කර ගැනීමට හැකි වූ බව යි. ඒ අනුව කවපෙත්ත විසි කිරීම සඳහා "ප්‍රථම" ස්ථානයත්, දුර පැනීම සඳහා "දෙ වන" ස්ථානයත්, මීටර් 100 කඩුළු පැනීම ඉසව්ව සඳහා "තුන් වන" ස්ථානයත්, ලබා ගනිමින් විශිෂ්ට ජයක් ශ්‍රී ලංකාවට ලබා දීමට ඇයට හැකි විය. ඇයගේ ඉදිරි කටයුතු සාර්ථක වීමට නිරතුරු ව ම අපි සුභ ප්‍රාර්ථනා කරන්නෙමු.

## අපේ වාර්තා

### කොළඹ දිස්ත්‍රික්කයෙන්

| | |
|---|---|
| තෝරා ගත් ග්‍රාම නිළධාරී කොට්ඨාස | 548 |
| කඩුවෙල/කොළොන්නාව අධ්‍යයනයෙන් | 59 |
| නිවුන් සංගනණයෙන් (කොළඹ දිස්) | 9360 |
| ප්‍රධාන නිවුන් දත්ත ලේඛනයෙන් | 6451 |
| මුළු ගණන | 16418 |

## බහුලව පවතින මානසික ගැටළු පිළිබඳ අධ්‍යයනය

2004 වසරේ දී අප විසින් සිදු කරන ලද නිවුන් සංගණනයෙන් පසුව එයින් අහඹු ලෙස තෝරා ගත් නිවුන් යුගල 2000ක් අප විසින් කරනු ලබන මානසික ගැටළු පිළිබඳ වූ අධ්‍යයනයට සහභාගී කරවා ගත්තෙමු. මේ වන විට එම අධ්‍යයනය ඉතා සාර්ථක ව නිම වෙමින් පවතී. නිවුන් යුගල් 2000කට අමතර ව සාමාන්‍ය පුද්ගලයන් ද මෙම අධ්‍යයනය සඳහා අපි සහභාගී කරවා ගත්තෙමු. මෙහි මූලික ම තේමා වනුයේ, ශ්‍රී ලංකාවේ බහුල ව පවතින මානසික ගැටළු (Common Mental Desoders), සියදිවි නසා ගැනීමේ සිතුවිලි හා මත්පැන් භාවිතයට බලපානුයේ කෙනෙකු ජීවත් වන පරිසරය ද නැතහොත් ජානමය බලපෑම් ද යන අංශ යි. මීට අමතර ව සම නිවුන් අය සඳහා, ඔවුන්ගේ කැමැත්ත මත, ශ්ලේෂ්මල පරීක්ෂාවක් (Bucal Smear) සිදු කර ඔවුන් නිසැක ව ම සම නිවුන්නු ද යන වග සොයා දන්වීමට ද අප බලාපොරොත්තු වෙමු. මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු දෙයක් වන්නේ මේ සියල්ල මෙම අධ්‍යයනයට සහභාගී වන අයගේ කැමැත්ත මත සිදු වන බව යි. පුහුණු කරන ලද අපගේ පර්යේෂණ සහායකයකු අධ්‍යයනයට සහභාගී වන නිවුන් හෝ නිවුන් නො වන පුද්ගලයාගේ නිවසට ම ගොස් අධ්‍යයනය සිදු කරයි. අප විසින් සකසා ගත් ප්‍රශ්නාවලී 2ක් දත්ත එක්රැස් කිරීමට භාවිත කළෙමු. මෙම ප්‍රශ්නාවලී 2ක ම, ලොව පිළි ගත් ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් අනුමත කරන ලද ප්‍රශ්නාවලි ඇසුරින්, අධ්‍යයනයට අවශ්‍ය කොටස් පමණක් උපුටා ගෙන, සකස් කරන ලද්දකි. සාමාන්‍යයෙන් පැය 2ක පමණ කාලයක් මෙම ප්‍රශ්නාවලී ඇසීම සඳහා ගත වේ. මේ ආකාරයට අප රැස් කර ගන්නා ලද තොරතුරුවල රහස්‍යභාවය සුරැකීමට විශේෂිත වූ අංකිත ක්‍රමයක් දත්ත ගබඩා කිරීමේ දී භාවිත කර ඇත. මේ වන විට දත්ත එක් රැස් කිරීමේ අවසාන අදියරට පැමිණ ඇති අතර ම අවසානයේ, සම්මත පටිපාටියකට අනුව ලකුණු ලබා දී අප තේමාවට අදාළ නිර්ණයන් ලබා ගැනීමට බලාපොරොත්තු වෙමු.

## ඔබගේ අත්දැකීම්/ සිතුවිලි/ නිරීක්ෂණ/අදහස් අපට ලියා එවන්න

ඔබ නිවුන් දරුවන් සිටින පාසලක ගුරුවරියක හෝ ගුරුවරයකු විය හැකි ය. නැත හොත්, ඔබ නිවුන් දරුවන් ඉන්නා මවක නැති නම් පියකු විය හැකි ය. ඔබ නිවුන් දරුවන් සම්බන්ධයෙන් ලත් සුවිශේෂ අත්දැකීම්, නිරීක්ෂණ නැති නම් ඔබට ඔවුන් පිළිබඳව දනෙන සිතුවිලි, ඔවුන්ගේ අධ්‍යාපනය, පුද්ගල පෞරුෂත්වය, හැසිරීම, ඔවුන් පාසලේ එකට සිටිය යුතු ද, නැතිනම් වෙන් කළ යුතු ද ආදී දේ පිළිබඳ ව අපට ලියන්න. ඔවුන් පිළිබඳ ව අප නො දන්නා බොහෝ දේ ඔබ දන්නවා විය හැකි ය. ඔබගේ වටිනා අදහස්, නිරීක්ෂණ, අත්දැකීම් ඔබට පමණක් නො ව, සමස්ත මානව වර්ගයාට ම ප්‍රයොජනවත් වනු ඇත. එබැවින් ඔබගේ අත්දැකීම් අදහස් අප වෙත ලියා එවන්න.

## මහගු සත්කාරයකට ඔබත් දායක වන්න ...

ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය වෙත නිවුන් දරුවන්ට ඇති අපහසුතා දක්වමින් මේ වන විට ලිපි රාශියක් ලැබී ඇත. ඔවුන්ට යම් පමණකින් හෝ ආධාරයක් ලබා දීමට ඔබත් කැමති නම්, අප හා එක්වන්න.

### ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ ලියාපදිංචි වීමට කැමති ඔබ සඳහා ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය - අයදුම්පත

නම ස්ත්‍රී/පුරුෂ

(1) ........................................ (1) ........................................

(1) ........................................ (1) ........................................

නිවුන් පුද්ගලයන්ගේ ලිපිනය (1) ........................................

(2) ........................................

දුරකථන අංක (1) ........................................

(2) ........................................

පදිංචි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය (1) .................... (2) ....................

පදිංචි දිස්ත්‍රික්කය (1) .................... (2) ....................

උපන් දිනය .................... වයස ....................

අත්සන (1) .................... (2) ....................

නිවුන් යුගල වයස 18 ට අඩු නම් මව හෝ පියාගේ අත්සන ....................

තොරතුරු සපයන අයගේ නම සහ ලිපිනය ........................................

........................................

උප්පැන්න සහතිකය අමුනා නොමැති නම්, තොරතුරු සත්‍ය බවට සහතික කරන අයගේ නම සහ ලිපිනය ........................................

........................................

---

**නිවුන් පුවත්**

වෙත

........................................

........................................

........................................

........................................

........................................

........................................

ආපසු
ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය
නො 762/4 බී
පන්නිපිටිය පාර, බත්තරමුල්ල